GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/11/24

## මාධ්‍ය නිවේදනයයි

උතුරු මැද ප්‍රදේශයෙන් ආරම්භ වී රට පුරා ව්‍යාප්ත වී ගෙන යන හේතුව අපැහැදිලි වකුගඩු රෝගය අද වන විට බරපතල සෞඛ්‍ය හා සමාජ ගැටලුවක් බවට පත් වී ඇත. මේ පිළිබඳව නිසි තොරතුරු රැස් කිරීමේ ක්‍රම වේදයක අවශ්‍යතාවය රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපති වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය මහතා විසින් කිහිපවිටක්ම අවධාරණය කර ඇත. මෙම ගැටලුව සම්බන්ධව සිදු කර ඇති පර්යේෂණ වාර්ථා එළි දැක්වීමේ සම්මන්ත්‍රණයක් මීට මාස කිහිපයකට පෙර අප සංගමය විසින් සංවිධානය කරන ලදී. එහිදී රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් වකුගඩු රෝගය නිවාරණය සම්බන්ධව දොලොස් වැදෑරුම් යෝජනාවලියක් රජයට ඉදිරිපත් කරන ලදී. එහි එක් යෝජනාවක් වනුයේ මෙම රෝග පිළිබඳව තොරතුරු වාර්තා කිරීමේ නිසි ක්‍රමවේදයක් සකස් කල යුතු බවයි. එම කාර්යභාරය උතුරු මැද වකුගඩු නිවාරණ ඒකකයේ වෛද්‍ය අසංග රණසිංහ මහතා සහා මොණරාගල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වෛද්‍ය ලක්නාත් වීරසේකර යන අප සාමාජිකයින් විසින් මනාව ඉටු කරමින් සිටින බව සතුටින් ප්‍රකාශ කරමු.

මේ සඳහා මග පෙන්වූ සෞඛ්‍ය අමාත්‍යාංශයේ මහජන සෞඛ්‍ය පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් වෛද්‍ය සරත් අමුණුගම මහතාට සහ වසංගත රෝග විද්‍යා අංශයේ අධ්‍යක්ෂ වෛද්‍ය පබා පලිහවඩන මහත්මිය ඉතා ගෞරවයෙන් සිහිපත් කරමු. මෙම තොරතුරු ඉදිරියේදී ග්‍රන්ථයක් වශයෙන් එලි දැක්වීමට බලාපොරොත්තු වන අතර එම තොරතුරු වල සාරාංශයන් අද දිනයේ මාධ්‍ය වෙත රජයේ වෛද්‍ය සංගමය මගින් නිකුත් කරනු ඇත. ඉදිරියේදී රෝග නිවාරණ කටයතු සැලසුම් කිරීම සඳහා මෙම තොරතුරු අදාල බලධාරීන් විසින් පාදක කොට ගනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

ස්තුතියි,

වෛද්‍ය ලසන්ත පිනදාස
ලේකම්

වැඩිදුර විස්තර සඳහා - වෛද්‍ය නලින්ද හේරත් - 0773495821
වෛද්‍ය සමන්ත ආනන්ද - 0777666301